(59)


සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

நலன்புரி நன்மைகள் சபை

**WELFARE BENEFITS BOARD**

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

**Ministry of Finance, Economic Stabilaization & National Policies**

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | MF/WBB/2/Notice7D/Div.s./2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.07. 31 |

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

<u>අයදුම්කරු වෙනුවට පවුලේ වෙනත් අයෙකු වෙත බැංකු ගිණුම් විවෘත කිරීම</u>

අසුවැසුම ප්‍රතිලාභීන් වෙත නව බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා අවශ්‍ය ලිපි ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් බැංකු වෙත නිකුත් කිරීමේදී පැනනගින ගැටළු අනුව වරින්වර ඔබ විසින් ඉදිරිපත් කරන ලද විමසීම් සැලකිල්ලට ගෙන මේ සම්බන්ධයෙන් මවිසින් නිකුත්කල උපදෙස්වලට අමතරව මෙම උපදෙස් නිකුත් කරනු ලැබේ. එවැනි ගැටළුකාරී අවස්ථාවන් පහත සඳහන් වේ.

i. අයදුම්කරු සිය පවුලේ නඩත්තුව සම්බන්ධ වගකීම් නිසිපරිදි ඉටුකිරීමට අපොහොසත් තත්වයක පවතින අතර කලත්‍රයා එම වගකීම් කරට ගෙන සිටින අවස්ථාවන්
ii. අයදුම්කරු මානසික හෝ ශාරීරික ආබාධිත තත්ත්වයක් හෝ වයස්ගතවීම නිසා බැංකුව සමඟ ගනුදෙනු කිරිමට අපහසු අවස්ථාවන්
iii. අයදුම්කරු මියගිය හෝ සිරගත වූ හෝ විදේශගත වූ අවස්ථාවන්
iv. අයදුම්කරු නීත්‍යානුකූලව දික්කසාද වී පවුලෙන් වෙන් වූ අවස්ථාවන්
v. අයදුම්කරු දික්කසාද නොවූවද පවුලෙන් වෙන් වී පවුල නඩත්තු නොකරන අවස්ථාවන්

ඉහත සඳහන් අවස්ථාවන් වලදී එම පවුලේ සුදුසු වැඩිහිටි තැනැත්තෙකු වෙත එම පවුල වෙනුවෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවන පරිදි සුදුසු තීරණයක් ගැනීම ඔබ වෙත පවරමි. ඒ අනුව අදාළ පුද්ගලයා නමින් ගිණුමක් විවෘත කිරීම සඳහා නියමිත ලිපිය සංශෝධනය කර නිකුත් කළ යුතුය.

02. මේ සම්බන්ධයෙන් ඔබෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

අ/කළේ. බී.විජයරත්න
සභාපති/ කොමසාරිස්

ආර්.පී.ආර්. රාජපක්ෂ
අතිරේක කොමසාරිස්(මෙහෙයුම්)

පිටපත:

1. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු. දැ.පි
2. සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව- ප්‍රාදේශීය කළමණාකරුවන් දැනුවත් වීම සඳහා
3. සාමාන්‍යාධිකාරී, මහජන බැංකුව- ප්‍රාදේශීය කළමණාකරුවන් දැනුවත් වීම සඳහා
4. සාමාන්‍යාධිකාරී, ජාතික ඉතිරිකිරීමේ බැංකුව- ප්‍රාදේශීය කළමණාකරුවන් දැනුවත් වීම සඳහා
5. සාමාන්‍යාධිකාරී, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව- ප්‍රාදේශීය කළමණාකරුවන් දැනුවත් වීම සඳහා


කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411- 2151481, 009411- 2484600/4117, Fax: 009411- 2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk